**සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2023**

-----------------------------------------------------------------------------------

සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ සහ 1969 අංක 12 දරන සමුපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයෙහි සංස්ථාවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණන කරනු ලබන අස්ථිත්වය විසින්ම එම අස්ථිත්වය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් සම්බන්ධයෙන් වූ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ අස්ථිත්වවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවද, 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් මාර්ගෝපදේශයෙහි 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු 2021, 2022 සහ 2023 වර්ෂවල පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය දක්වාම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**1.3 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්**

(අ) සංස්ථාව විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | රු. |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 6,458,394,856 |
| ජංගම වත්කම් | 4,592,315,521 |
| **මුළු වත්කම්** | **11,050,710,377** |
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | (2,941,269,573) |
| <u>වගකීම්</u> | |
| ජංගම නොවන බැරකම් | 8,310,536,743 |
| ජංගම බැරකම් | 5,681,443,207 |
| **මුළු වගකීම් හා ස්කන්ධය** | **11,050,710,377** |

| | |
|---|---|
| මුළු ආදායම | 26,393,113 |
| මුළු වියදම | 645,368,369 |
| | -------------------- |
| **අතිරික්තය / (ඌණතාවය)** | **(618,975,255)** |
| | =========== |

## 2. විගණන නිරීක්ෂණ

### 2.1 සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම

(අ) සංස්ථාව පිහිටුවීමේ අරමුණු ඉටු නොවීම හේතුවෙන් ආර්ථිකයට ඵලදායි දායකත්වයක් ලබානොදීම මත සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමට වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය තීරණය කර තිබුණි. ඒ අනුව සමුපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස) ප්‍රතිව්‍යුහගත කිරීම යන මැයෙන් 2023 ජූනි 26 දින වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද 2023 ජූලි 10 දිනැති අමප 23/1208/627/018 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එම තීරණය අනුව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් (CRS) යටතේ සංස්ථාවේ සේවය කළ සියළුම සේවකයින් (288 දෙනෙකු) 2023 සැප්තැම්බර් 30 දින විශ්‍රාම ගන්වා තිබුණි. ඒ වෙනුවෙන් වන්දි වශයෙන් රු.353,754,444 ක මුදලක් ගෙවා තිබුණි.

### 2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමුපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස) ප්‍රතිව්‍යුහගත කිරීම යන මැයෙන් 2023 ජූනි 26 දින වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2023 ජූලි 10 දින ඉදිරිපත් වූ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අංක 1.1 ප්‍රකාරව එවකට පැවති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ චංචල දේපල විකිණීම සිදුකල යුතු වූ අතර එම නිරීක්ෂණවලට යටත්ව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. කෙසේ වුවද, සංස්ථාවේ ලොරි රථ 51 ක් 2024 ජනවාරි දක්වා විකුණා තිබුණු අතර ඊට අදාල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2024 දෙසැම්බර් 03 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කර ඇති බව තහවුරු නොවුණි. | පිළිතුරු සපයා නොතිබුණි | අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 නොවැම්බර් සිට 2024 නොවැම්බර් දක්වා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ විගණනයට ඉදිරිපත් නොවුණි. | පිළිතුරු සපයා නොතිබුණි | අධ්‍යක්ෂ මණ්ඩල තීරණ විගණනයට ඉදිරිපත් කල යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 395 (ඇ) | සංස්ථාව විසින් පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුම් 08 ක් සම්බන්ධයෙන් 2023 සැප්තැම්බර් මාසයේ සිට 2024 සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශන 2024 ඔක්තෝබර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. එම කාලපරිච්ඡේදය සඳහා එකී බැංකු ගිණුම් වලට අදාල බැංකු ප්‍රකාශණ ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2023.09.30 දින සංස්ථාවේ සියළු සේවකයින් අනිවාර්ය විශ්‍රාම ගැන්වීම හේතුවෙන් බැංකු සැසඳුම් පිළියෙල කිරිම සඳහා නිලධාරියෙකු නොමැති වීමෙන් මෙම ක්‍රියාවලිය ප්‍රමාද වී ඇති අතර, නව වැඩබලන සභාපති වරයෙක් 2024.10.14 දින පත් කිරිම මත බැංකු සැසඳුම් පිළියෙල කිරිම ආරම්භ කර ඇත. ඒ අනුව ඉදිරියේදී බැංකු සැසඳුම් වාර්තා ඉදිරිපත් කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැංකු සැසඳුම් පිළියෙළ කිරිමට කටයුතු කල යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 756(6) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සංස්ථාවේ සියළුම සේවකයින් අනිවාර්ය විශ්‍රාම ගැන්වීම හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොමැත. ඉදිරියේදි සුදුසු කාර්යය මණ්ඩලයක් අනියුක්ත කිරිම මගින් භාණ්ඩ සමීක්ෂණයක් සිදු කිරිමට අපේක්ෂා කරන අතර එම වාර්තාවේ පිටපතක් ඉදිරියේදී ලබා දෙන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීමට කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2023 සැප්තැම්බර් 14 දිනැති සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල චක්‍රලේඛ අංක 01/2023 හි 7 ඡේදය සහ මුදල් රෙගුලාසි 103 හා 104 | සේවකයින් විසින් සංස්ථාවෙන් ලබා ගෙන ඇති ණය, සංස්ථාව වෙත ගෙවීමට නියමකර ඇති සියළුම අයකිරීම් හා විනය නියෝග මත ගෙවීමට නියමිත සියළු ගෙවීම් අඩුකිරීමෙන් පසු වන්දි මුදල් නිදහස් කල යුතු වුවද, 2018 හා 2019 වර්ෂයන්හිදී සිදු වූ මාර්ගස්ථ අඩුමාන වෙනුවෙන් සේවකයන්ගෙන් අයවිය යුතු එකතුව රු.16,530,969 ක් වූ මුදල් අයකර ගැනීමෙන් තොරව වන්දි මුදල් ගෙවා තිබුණි. | ගිණුම් හා නීති අංශය මගින් සහතික කර ලබා දුන් තොරතුරු අනුව සේවකයින්ගෙන් අයකරගත යුතු සියළු අයකිරීම් අයකර ගැනීමෙන් පසුව වන්දි ගණනය කර අවසාන ගෙවීම් සිදු කර ඇති බව හා අයකරගත යුතු මාර්ගස්ත අඩුමාන සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තා පිළියෙල කිරිමෙන් පසුව වැඩිදුර තොරතුරු ඉදිරිපත්කරන බව. | සේවකයන්ගෙන් අයවිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනයට ඉදිරිපත් කරන ලද ලංකා සතොස සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව එදිනට සංස්ථාව වෙත එම සමාගමෙන් අයවිය යුතු ශේෂය රු.1,688,225,936 ක් වූ අතර සංස්ථාවෙන් එම සමාගම වෙත ගෙවිය යුතු ශේෂය රු.10,083,353 ක් විය. | පිළිතුරු සපයා නොතිබුණි . | ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ නිරවුල් කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කුලී පදනම මත ලබා දී ඇති සංස්ථාවේ දේපල වෙනුවෙන් 2023 වර්ෂය සඳහා ලැබිය යුතු රු.17,031,455 ක් සහ 2024 ජනවාරි සිට ජූනි දක්වා ලැබිය යුතු රු.67,831,100 ක් වශයෙන් එකතුව රු. 84,862,555 ක් වූ කුලී ආදායම 2024 ජූලි 15 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | මාසික බදු කුලිය අයකර ගැනීම සම්බන්ධයෙන් විස්තරාත්මක විශ්ලේෂණයක් දැනට ආරම්භ කර ඇති අතර හිඟ හිටි කුලී ආදායම් හා ඒවා එකතු කිරිමට අදාල කටයුතු දැනට ක්‍රියාත්මක කර ඇති අතර අදාල විස්තරාත්මක වාර්තාවක් ඉදිරියේදි ලබා දෙන බව. | කුලී ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ලිඛිත ගිවිසුම් වලට ඇතුළත් නොවීම හේතුවෙන් ලංකා සතොස සමාගම විසින් ඉන්වොයිසියේ සඳහන් වටිනාකමට වඩා අඩුවෙන් බදු කුලී ගෙවා තිබීම හේතුවෙන් 2023 සැප්තැම්බර් සිට 2024 පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදය තුළ සංස්ථාවට අහිමි වූ බදු කුලී ආදායම රු. 13,161,592 ක් වී තිබුණි. | ලංකා සතොස ආයතනය සමඟ එකඟ වී ඇති බදු කුලි ගිවිසුම් නැවත කුලි ආදායම් තක්සේරුවක් ලබා ගැනීමෙන් පසුව හිඟ බදු මුදල් ලබා ගැනීමට කටයුතු සැලසුම් කර ඇති බව. | දේපල බදු දීමේදී විධිමත් තක්සේරුවක් මත ලිඛිත ගිවිසුම් වලට එළඹිය යුතුය. |
| (ඇ) පෞද්ගලික බදුකරුවන් 21 දෙනෙකු සමඟ ලිඛිත ගිවිසුම් වලට එළඹීමෙන් තොරව වාර්ෂික බදු කුලී ආදායම රු. 1,558,786 ක් වූ වර්ග අඩි 35,332 ක දේපල බදු පදනමින් ලබා දී තිබුණි. | මේ සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් ලබා ගැනීමට නොහැකි අතර ඉදිරියේදි තොරතුරු සනාථ කිරීමෙන් පසු විස්තරාත්මක පැහැදිලි කිරිමක් ඉදිරිපත් කරන බව. | -එම- |
| (ඈ)සියළුම සේවකයින් විශ්‍රාම ගැන්වීමෙන් පසු සංස්ථාවේ කටයුතු සඳහා වැඩ බැලීමේ පදනමින් පත් කර තිබූ සී/ස ලංකා සතොස සමාගමේ නිලධාරීන් 30 දෙනෙකුට 2023 ඔක්තෝබර් 01 දින සිට 2024 අගෝස්තු 31 දින දක්වා කාලපරිච්ඡේදය තුල එකතුව රු.4,410,412 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි. එසේ වුවද එම නිලධාරීන්ගේ පත් කිරීම් වලට අදාල පත්වීම් ලිපි, කාර්ය පැවරුම් ලැයිස්තු සහ දීමනා ගෙවීමට අදාල ගෙවීම් වවුචර්පත් ආදිය විගණනයට ඉදිරිපත් නොවුණි. තවද, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, වත්කම් කලමනාකරණය, බැංකු ගිණුම් හා වියදම් කලමනාකරණය සහ කුලී ආදායම් එක්රැස් කිරීම වැනි මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව හා කාලීනව ඉටු කර නොතිබුණි. | ලංකා සතොස ආයතනයේ සේවකයින් තාවකාලිකව වැඩ ආවරණය කිරීමේ පදනම යටතේ වරින් වර අනියුක්ත කර ඇති අතර අදාල සියළු තොරතුරු ඉදිරියේදි ඉදිරිපත් කරන බව. | සේවා අවශතාවයට ගැලපෙන ලෙස වැඩ බැලීමේ පත් කිරීම් කළ යුතු අතර අදාළ නිලධාරීන් විසින් තම වගකීම් නිසි ලෙස ඉටු කරන බවට කළමනාකරණය සහතික විය යුතුය. |
| (ඉ)2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(ඉ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසිමාවක් තුල සියලු විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන් දීමේ නිලධාරියා සහතික විය යුතු වුවද, 2023 ඔක්තෝබර් 16 දින සිට 2024 සැප්තැම්බර් 10 දක්වා නිකුත් කරන ලද විගණන විමසුම් 05 ක් සඳහා මෙම වාර්තාවේ දින වන විටත් පිළිතුරු සපයා නොතිබුණි. | සියළු සේවකයින් විශ්‍රාම ගැන්විම නිසා විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීමේ ප්‍රමාදයක් සිදු ව ඇත. ඉදිරියේදී ඉල්ලා ඇති තොරතුරු ක්‍රමාණුකුලව ලබා දෙන බව. | විගණන විමසුම්වලට කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ පවතින වත්කම් හා වගකීම් සහ සංස්ථාවේ පරිපාලිත සමාගම් දෙක සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි පියවර සහ සමුපකාර තොග වෙළඳ සංස්ථාව ඈවර කිරීම සම්බන්ධයෙන් තීරණය කිරීම සඳහා නිලධාරි කමිටුවක් පත් කර එම කමිටුවේ වාර්තාව මාස 02 ක් තුළ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතු බවට 2023 ජූලි මස 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් ලබා දී තිබුණි. එකී කමිටුවේ වාර්තාව ඇතුලත් අමාත්‍ය මණ්ඩල සංදේශය මාස 11 ක කාල ප්‍රමාදයක් සහිතව 2024 අගෝස්තු 23 දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණු අතර ඒ අනුව සංස්ථාව ඈවර කිරීමට 2024 සැප්තැම්බර් 02 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එසේ වුවද විගණිත දිනය වන 2024 ඔක්තෝබර් 31 දින වන විටත් අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන කරුණු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 නොවැම්බර් සිට 2024 ජනවාරි දක්වා කාලපරිච්ඡේදය තුල සංස්ථාවට අයත් ලොරි රථ 51 ක් විවෘත වෙළඳපල මිල ගණන් කැඳවීම මඟින් විකුණා තිබුණු අතර විකුණන ලද ලොරි රථ 43 ක් එනම්, සියයට 84 ක් ගැණුම්කරුවන් දෙදෙනෙකු වෙත පමණක් විකුණා තිබුණි. | කැබිනට් පත්‍රිකාව පරිදි සේවකයින් විශ්‍රාම ගැන්වීමට අදාල සම්පූර්ණ වන්දි මුදල් සතොස ආයතනයේ පැවති තැන්පතු මගින් හා ඉතිරිය මෝටර් රථ උපලබ්ධිය මගින් ලබා ගැනිමට නිර්දේශ කර ඇති අතර ඒ අනුව ලොරි රථ යම් ප්‍රමාණයක් විකුණා ඇති බවට තොරතුරු අනාවරණය වී ඇත. එම ලොරි රථ විකිණීමට අදාල ගනුදෙනු හා ඊට අදාල ටෙන්ඩර් සම්බන්ධ ලියවිලි පරික්ෂා කිරීමෙන් අනතුරුව වැඩිදුර තොරතුරු ඉදිරියේදී ඉදිරිපත් කරන බව. | දේපල විකිණීමේදී ආයතනයට වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි කාර්යක්ෂම තීරණ ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රදානය කිරීමේ ලිපිය අනුව ලිපිය ලැබී දින 10ක් ඇතුළත ලොරි රථ සඳහා මුදල් ගෙවිය යුතු බව ගැණුම්කරු වෙත දන්වා තිබුණද ලොරි රථ 18 ක් සඳහා මුදල් ලැබීම දින 08 සිට දින 62 දක්වා ප්‍රමාද වී තිබුණි. | මේ පිළිබඳ කරුණු සොයා ඉදිරියේදී ඉදිරිපත් කරන බව. | අයවිය යුතු මුදල් නියමිත කාල සීමාව තුල අයකර ගත යුතුය. |
| (ඇ) විකුණන ලද ලොරි රථ 51 සඳහා 2023 දෙසැම්බර් 20 දින සිට 2024 ජූනි 26 දින දක්වා කාලපරිච්ඡේදය තුල රු.183,985,149 ක මුදලක් ලැබී තිබුණු අතර මෙම මුදල් සී/ස ලංකා සතොස සමාගමට අයත් බැංකු ගිණුමට බැර කර තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | සංස්ථාවේ වත්කම් විකිණීමෙන් ලද මුදල් සංස්ථාවේ බැංකු ගිණුම් වලට රැස්කළ යුතුය. |

**3.4 නිශ්කාර්ය සහ ඌන උපයෝජිත වත්කම්**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2024 සැප්තැම්බර් 25 වන දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාව අනුව සංස්ථාවට අයත් ලොරි රථ 37 ක් සහ යතුරු පැදි 02 ක් සංස්ථාවේ ප්‍රවාහන අංගනයේ නිශ්කාර්යව ගාල් කර පැවති අතර ආවරණයක් රහිතව ස්වාභාවික අපදාවන්ට ලක්වෙමින් වසරකට ආසන්න කාලයක් ගාල් කර තිබීම හේතුවෙන් දිරාපත් වෙමින් පැවතුනි. තවද එම අවස්ථාවේ සංස්ථාව තුල භෞතිකව නොපැවති ලොරි රථ 02 ක් වසරකට අධික කාලයක් තිස්සේ අලුත්වැඩියාවන් සඳහා ගරාජ වෙත යොමු කර තිබුණු බවද අනාවරණය විය. | පිළිතුරු ලබාදී නොතිබුණි. | වත්කම්වල ආරක්ෂාව තහවුරු කල යුතු අතර උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව භාවිතා කිරීම හෝ යෝග්‍ය පරිදි අපහරණය කිරීම කළ යුතුය. |
| (ආ)වසර 18 කට ආසන්න කාලයක් ඌන උපයෝජිතව පැවති පැයකට සහල් කි.ග්‍රෑ 2,000 ක් බැගින් සැකසීමේ ධාරිතාවයක් සහිත සංස්ථාව සතු හිඟුරක්ගොඩ සහ පන්නෙගමුව සහල් සැකසීමේ සංකීර්ණ දෙක 2024 අගෝස්තු 20 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | සියළු සේවකයින් අනිවාර්ය විශ්‍රාම ගැන්වීම නිසා ඊට අදාල විස්තරාත්මක තොරතුරු සොයා ගත නොහැකි බව. | සංස්ථාව සතු වත්කම් ආදායම් ඉපයීම සඳහා කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |